# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1653/9 - 2010 මැයි 11 වැනි අඟහරුවාදා - 2010.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

*ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :* 4610.
*විශේෂ්‍ය අංකය :* ර/48.

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

පහළ කරඳන වත්ත, කලටුවාව පදිංචි හෙන්දිරිගේ පරාක්‍රම ගුණසේකර මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩ දෙන ලද ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

නීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2010 මැයි මස 11 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දී ය.

උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ කරඳන යන ගමේ පිහිටි සර්වෙයාර් ජනරාල් විසින් අදින ලද අ. ග. පි. අංක 219 හි අතිරේක අංක 22 හි දැක්වෙන කරඳන වත්ත නැමති ඉඩමේ ලොට් අංක 890, 891 දරන බිම් කැබලි වලින් නොබෙදු අක්. 34, රූඩ් 3, පර්. 11 ක ප්‍රමාණය ඇති බිම් කොටසද,

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ කරඳන යන ගමේ පිහිටි සර්වෙයාර් ජනරාල් විසින් අඳින ලද අ. ග. පි. අංක 219 හි අතිරේක අංක 52 හි දැක්වෙන වැවල වත්ත නැමති ඉඩමේ හෙක්. 5.0966 ක ප්‍රමාණය ඇති ලොට් අංක 2271, 2273, 2274 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිද,

3. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ කරඳන යන ගමේ පිහිටි සර්වෙයාර් ජනරාල් විසින් අඳින ලද අ. ග. පි. අංක 219 හි අතිරේක අංක 53 හි දැක්වෙන කරඳන වත්ත නැමති ඉඩමේ හෙක්. 0.7893 ක ප්‍රමාණය ඇති ලොට් අංක 2277 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිද වේ.

05-637

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.